# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2269/6 - 2022 පෙබරවාරි මස 28 වැනි සඳුදා - 2022.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

**ජනාධිපති විධානය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් වර්ෂ 2021 ඔක්තෝබර් මස 26 දිනැති ජනාධිපති විධානය මගින් "එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය" පිහිටුවනු ලැබ ඇති හෙයින් ද,

එකී කාර්ය සාධක බලකාය වෙත පවරනු ලැබූ කාර්යයන් හා වගකීම් සපුරාලීම සඳහා ලබා දී තිබූ කාලය 2022 පෙබරවාරි මස 28 දිනෙන් අවසන් වීමට නියමිත බැවින් ද,

දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි මහජන අදහස් ලබා ගැනීමට හා විද්වත් මණ්ඩල වලින් අදහස් ලබා ගැනීමට අවශ්‍ය වන බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, උක්ත කාර්ය සාධක බලකායේ කාර්යයන් සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් තුළ කාර්යක්ෂම ලෙස සිදුකොට අවසන් කිරීම පිණිස කාර්ය සාධක බලකායේ කාලය 2022 පෙබරවාරි මස 28 වැනි දින සිට තවත් මාස තුනකින් දීර්ඝ කරමි.

වර්ෂ දෙදහස් විසිදෙකක් වූ පෙබරවාරි මස 28 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ගාමිණී සෙනරත්,**
ජනාධිපති ලේකම්.

EOG 02 - 0692


1A - G 36226 — 370 (2022/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*